
# අස්ගිරි මහාවිහාරය
# සහ
# 1818 පළමු නිදහස් සටන




සංස්කරණය

ඇටිපොල මහින්ද හිමි

කැටකුඹුරේ ධම්මාරාම හිමි

ඇහැලේපොල මහින්ද හිමි

අජිත් තල්වත්ත

# අස්ගිරි මහාවිහාරය
# සහ
# 1818 පළමු නිදහස් සටන

සංස්කරණය

ශාස්ත්‍රපති ඇටිපොල මහින්ද හිමි
B.A.(Hons), M.A.(PDN), Dip.in Edu.(COL)

දර්ශනපති කැටකුඹුරේ ධම්මාරාම හිමි
B.A.(Hons), M.Phil, (PDN)

රාජකීය පණ්ඩිත ඇහැලේපොල මහින්ද හිමි
B.A.(Hons), (SJP), M.A. (KLN), Royal Pundith (O.S.S)

ආචාර්ය අජිත් තල්වත්ත
B.A.(Hons), M.A. (PDN), M.Phil, PhD. (KLN)

මෙහි දක්වෙන ලිපිවල අයිතිය ඒ ඒ කතුවරු සතුවන අතර එම ලිපිවල අන්තර්ගතය පද බෙදීම, අක්‍ෂර වින්‍යාශය ආදි සියලු කරුණු සම්බන්ධව වගකීම ද ඒ ඒ කතුවරු සතුය.

**අස්ගිරි මහාවිහාරය සහ 1818 පළමු නිදහස් සටන**

© ශාස්ත්‍රපති ඇටිපොල මහින්ද හිමි, දර්ශනපති කැටකුඹුරේ ධම්මාරාම හිමි, රාජකීය පණ්ඩිත ඇහැලේපොල මහින්ද හිමි, ආචාර්ය අජිත් තල්වත්ත

පළමු මුද්‍රණය - 2019

ISBN - 978-955-1478-01-8

පරිගණක පිටු සැකසුම - ජී. එච්. ජී. මහේෂිකා මධුභාෂිණී
- රාජකීය පණ්ඩිත ඇහැලේපොල මහින්ද හිමි

කස්ද්වුකය නිර්මාණය - ආචාර්ය සුදර්ශන බණ්ඩාර

කවරයේ සිතුවම - එච්. ජී. සඳුන් ප්‍රභාත් කුලරත්න

ප්‍රකාශනය - අස්ගිරි මහාවිහාරය, අස්ගිරිය, මහනුවර.

මුද්‍රණය - ක්‍රියේටිව් ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගම, මහනුවර.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උක්කුබණ්ඩා කරුණානන්ද
B.A. (Hons), (KLN), PhD. (London)
ඉතිහාසය අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මහින්ද සෝමතිලක
B.A. (Hons), M.A.(PDN), PhD. ( London)
ඉතිහාසය අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග
B.A.(Hons),(KLN), M.A.(Poona), M.Sc. (KLN), FSLCA
අධ්‍යක්ෂක, උරුම අධ්‍යයන කේන්ද්‍රය, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

පූජ්‍ය මහාචාර්ය අලහේනේගම සුමනරතන නාහිමි
B.A. (Hons), Dip In Ed., M.A., PhD. ( PDN)
භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.

මහාචාර්ය අලෙක්සැන්ඩර් කපුකොටුව
B.A.(Hons), (SJP), M.Sc. (PGIR), PhD. (Gilin University - China)
අංශාධිපති, ඉතිහාසය සහ පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, සභාපති, පුරාවිද්‍යාඥයන්ගේ සභාව.

මහාචාර්ය චන්ද්‍රන රෝහණ විතානාච්චි
B.A. (Hons), (KLN), M.A. (SJP), PhD. (KLN)
පීඨාධිපති, සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

මහාචාර්ය ඩී. තුසිත මෙන්ඩිස්
B.A.(Hons), (PDN), PGD Dip. (PGIR-KLN), PDG Dip. (PGIAR-KLN) M.Phil. (PGIAR-KLN), PhD. (PGIAR-KLN)
අංශාධිපති, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

මහාචාර්ය කේ.ඩී. පරණවිතාන
B.A.(Hons), (PDN), PhD. (UNSW)
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

ආචාර්ය රෝහිත දසනායක
B.A.(Hons), (PDN), M.Sc.(KLN), PhD. (Madras)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

නිතිඥ ආචාර්ය ඩිල්මා තුෂාරි කොග්ගලගේ
B. A. (Hons), (COL), M.Phil, PhD. (KLN)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

# පටුන

පිටු අංක

## පළමු කොටස


මහාවිහාර සම්ප්‍රදාය හා එහි සැලැස්ම 1
ඩී. තුසිත මැන්දිස්

මහනුවර අස්ගිරි මහාවිහාරයේ වාස්තුවිද්‍යා නිර්මාණ 15
එම්.ආර්.ආර් ශ්‍යාමලී ගුණරත්න

අස්ගිරි මහාවිහාරීය උපෝසථාඝර 35
පූජ්‍ය මැදගම ධම්මානන්ද නාහිමි
පූජ්‍ය ඇහැලේපොල මහින්ද හිමි

අස්ගිරි මහාවිහාරය සතු අභිලේඛන, සන්නස් සහ තුඩපත් 45
එම්.ඒ. ප්‍රසාද් කුමාර

පරමධර්ම කතිකාවත  අස්ගිරි මහාවිහාරයේ ඉතිහාසය හා සබැඳි පැරණි ලේඛනයක් 60
කේ. ඩී. පරණවිතාන

අස්ගිරි මහාවිහාරයට අයත් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් ලේඛන 78
හිමාලි වීරකෝන්

බෞද්ධාගමික පුනර්ජීවනය ඇති කිරීමට අස්ගිරි මහාවිහාරයීය දායකත්වය 85
පූජ්‍ය මාදිපොල විමලජෝති හිමි

උභය මහාවිහාරය සතු ශාසනික හා නෛතික බලය 98
පූජ්‍ය මුරුද්දෙණියේ ධම්මරතන හිමි

සෙංකඩගලපුර අස්ගිරි මහාවිහාරය සහ එහි සුවිශේෂතා 106
අතිපූජ්‍ය ආණමඩුවේ ශ්‍රී ධම්මදස්සි අනුනාහිමි

අස්ගිරිය  මල්වත්ත මහාවිහාර හා මධ්‍යම පළාතේ රජමහාවිහාර ආශ්‍රිත ජනශ්‍රැති 121
නන්දන මිල්ලගල


## දෙවන කොටස


මලය රටෙහි ඓතිහාසිකත්වය 135
පූජ්‍ය කුඩාවැවේ සෝමානන්ද හිමි

උඩරට රාජධානියේ ඓතිහාසික වර්ධනය 152
අලෙක්සැන්ඩර් කපුකොටුව
දමිත් රණගල

උඩරට පාලකයින් අතර කීර්ති ශ්‍රී රාජසිංහ රජුට හිමිවන වැදගත්කම 163
මහින්ද සෝමතිලක

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍ය පිහිටුවීම 185
ඩී. ජේ. කේ. ඉහළගෙදර

# උඩරට රාජධානියේ ඓතිහාසික වර්ධනය

අලෙක්සැන්ඩර් කපුකොටුව
දමිත් රණගල

## හැඳින්වීම

ලංකා ඉතිහාසයේ ඈත අතීතයේ දී රට මැද පිහිටි කඳුකර ප්‍රදේශය ජනාකීර්ණ දියුණු සභ්‍යත්වයක් සහිත රාජධානි මධ්‍යස්ථානයක් නොවී ය. අනුරාධපුර යුගයේ දී දැඩි වනවැස්මකින් යටව පැවති මෙම භූමි ප්‍රදේශය කඳුරට යන අර්ථය දුන් ''මලෙයි'' යන දෙමළ වචනයෙන් බිඳී ආ මලය දේශය, මලය මණ්ඩලය, මලය රට සහ මලයාණ්ඩු වශයෙන් හඳුන්වනු ලැබී ය.[1] දාහතරවන සියවසෙන් පසු අවධියේ සිට වර්තමානය දක්වා උඩරට හෝ කන්ද උඩරට නමින් රට මැද පිහිටි එම කඳුකර ප්‍රදේශය ප්‍රකටව පැවතුණි. ගම්පොල රාජ්‍ය මධ්‍යස්ථානය ලෙස පැවති සමයේ දී කන්ද උඩ පස්රට[2] නමින් එකී භූගෝලීය කලාපය හඳුන්වනු ලැබූ බව පෙනේ.

## විමර්ශනය

### රජරට ශිෂ්ටාචාර සමයේ උඩරට ප්‍රදේශ

ක්‍රිස්තු පූර්ව අවධියේ දී ආර්යයන් උඩරට ප්‍රදේශවල තරමක් දුරට ව්‍යාප්ත වූ බවට පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛන සාධක පවතී. මහනුවර දිස්ත්‍රික්කයට අයත් හාරිස්පත්තුවේ දූල්වලින් බ්‍රාහ්මී ලිපි හතරක් ද හාරිස්පත්තුවට ම අයත් මොලගොඩින් ලිපි එකක් ද තුම්පනේ බඹරගලින් ලිපි හතරක් ද උඩුනුවර වේගිරිය දේවාලයෙන් ලිපි දෙකක් ද වශයෙන් බ්‍රාහ්මී ලිපි කිහිපයක් ලැබී තිබේ.[3] භික්ෂූන් වහන්සේලාට එම ලෙන් පූජා කළ අය අතර පරුමකයන් පස් දෙනෙක් ද මැණික් කර්මාන්තයේ නියැලි ශිල්පියෙක් ද ඇත් දත් කර්මාන්තයේ නියැලි ශිල්පියෙක් ද වූ බව සඳහන් වේ. ක්‍රි. පූ. අවධියවන විටත් උඩරට ප්‍රදේශයේ සමාජ ආර්ථික වශයෙන් යහපත් තත්ත්වයක් සහිත පිරිසක් ජීවත් වූ බවට එම සාධක අනුව පැහැදිලි වේ.

ක්‍රි. පූ. දෙවන හා පළමු සියවස්වල දී උඩරට ප්‍රදේශයේ ඇති වූ මෙම ආර්ය ජනාවාස ව්‍යාප්තිය තාවකාලික එකක් වූ බව ක්‍රිස්තු වර්ෂ දෙවන සියවස පමණ වන විට ශිලාලේඛන උඩරට ප්‍රදේශවලින් නැවත හමු නොවීමෙන් පැහැදිලි වේ. මුල දී උඩරට ප්‍රදේශවල පදිංචි වූ ජනයාගෙන් පැවත එන්නන් ද පහසුවෙන් එළි කළ හැකි හා වී වගාවට වඩාත් යෝග්‍ය වූ වියළි කලාපයේ තැනිතලා ප්‍රදේශවලට සංක්‍රමණය වීම මෙම ශිලාලේඛන හිඟයට

1 අබයසිංහ ටිකිරි, දේවරාජ් ශ්‍රීමතී, සෝමරත්න ජී. පී. වී., උඩරට රාජධානිය (1470 1818), සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්මන්ට්ස් සමාගම, කොළ, 1977,01 පිට.

2 ගම්පොල තුන්වන වික්‍රමබාහු රජුගේ මඩවල ගිරි ලිපියට අනුව සිදුරුවාණ, බලවිට, මාතලේ, දුම්බර හා සගම තුන්රට කන්ද උඩරට පස් රටට අයත් වූ බව සඳහන් වේ, IC., Vol. VII, 2014, PP 63.

3 IC., Vol. I, 1970, PP 62 - 63.

හේතුව විය හැකි ය.[4]එතැන් පටන් අනුරාධපුර රාජධානියේ අවසානය භාගය වන තෙක් උඩරට සිංහල ජනයා පැතිරී ගිය ප්‍රදේශයක් නොවී ය. එහෙත් අනුරාධපුර රාජධානි අවධිය පුරාම මලය රට නමින් හැඳින්වුණු උඩරට ප්‍රදේශය පරසතුරු ආක්‍රමණවලට රජරට ප්‍රදේශ යටත් වූ අවස්ථාවල දී ඒ ආක්‍රමණිකයන්ට විරුද්ධව සිංහලයන් ගෙනගිය ව්‍යාපාරවලට රැකවරණය සලසා දුන් ප්‍රදේශයක් වශයෙනුත් රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ මෙහෙය වූ කැරලිකරුවන්ට, කුමාරවරුන්ට හා නීතියේ රැහැණින් මිදුණවුන්ට අභයස්ථානයක් වූ බවත් වංසකථා තොරතුරුවලින් අනාවරණය වේ. ස්වභාවධර්මයා විසින් සලසා දුන් විෂම කඳු සහිත ස්වභාවයත්, දැඩි වන වැස්මත්, ජල ප්‍රවහයනුත් අභයස්ථානයක් වශයෙන් උඩරට ප්‍රදේශ වැදගත් වීමට මහත් සේ උපස්ථම්භක වූ බව නොරහසකි.

## නිරිතදිග ශිෂ්ටාචාර සමයේ උඩරට ප්‍රදේශ

ක්‍රි. ව. 1215 කාලිංග මාඝ ආක්‍රමණය හේතුවෙන් රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමත් සමග මෙරට වියළි කලාපය කේන්ද්‍ර කරගනිමින් ප්‍රධාන වශයෙන් පැවති ලාංකික ජනගහනය බහුල වශයෙන් නිරිත දිග තෙත් කලාපයට විතැන් විය. සතුරු සේනාවන්ගේ පීඩාවට ලක් වූ මැති ඇමති ආදී වූ ජන ප්‍රධානින් හා වෙනත් ජනීජනයන් දහස් ගණනින් ස්වකීය ගම් හා නගර අතහැර රැකවරණය පතා වනදුර්ග හා ගිරි දුර්ග සොයාගිය බව එළු අත්තනගලු වංසයේ ද සඳහන් වේ.[5]සිංහලයන්ගේ රාජකීය සංකේතයන් වූ දන්ත ධාතූන් වහන්සේ සහ පාත්‍ර ධාතූන් වහන්සේ ද ආරක්ෂාව පතා උඩරට කොත්මලේ ප්‍රදේශයට වැඩම කොට භූගතව නිධන් කළ බව **''පොළොන්නරුවෙන් පාත්‍ර ධාතු ගෙන, මහගල් වල් නැඟී, එහින් රැක ලිය නොහැකි හෙයින් කොත්මලේ භූමි නිධාන කොට''** වශයෙන් පූජාවලියේ සඳහන් වී ඇත.[6] එළු අත්තනගලු වංසයේ ද **''එකල්හි බුදුන්ගේ ශ්‍රී දන්තධාතු රක්ෂායෙහි නියුක්තවූ මහා ස්ථවිරාදිවූ යතිවරයෝ දළදා කරඬුව ද පාත්‍ර ධාතූන් වහන්සේ ද ගෙන ගොස් කොත්මල නම් ගිරිදුර්ග ජනපදයට පැමිණ දළදා පාත්‍ර ධාතූන් වහන්සේ ප්‍රකාශ කොට තබා රක්ෂා කර ගන්නට අසමාර්ථවූවාහු සුදුසු භූමියක්හි නිධාන කොට තබා අන්‍යස්ථායකට ගියාහු යැ''** වශයෙන් එම කරුණ සඳහන් වේ.[7]මෙම තත්ත්වය තුළ මායා රටේ (දක්ඛිණ දේශයේ) මෙන් ම උඩරට ප්‍රදේශවල ද ජනගහනය ඉහළ ගිය බව පෙනේ. එම ජනගහන වර්ධනය දහහතරවන සියවසේ දී සිංහල රජුන්ගේ පාලන මධ්‍යස්ථානය ලෙස උඩරට ප්‍රදේශයට අයත් මහවැලි ගඟ අසල පිහිටි ගඟසිරිපුර හෙවත් ගම්පොල රාජධානිය වශයෙන් තෝරා ගැනීමට මුල් විය. වර්ෂ 1341 පමණ සිට 1409 දක්වා ගම්පොල ලංකාවේ අගනුවර වශයෙන් පැවතිණි. ගම්පොල මුල් කරගෙන අඩසියවසක් පමණ කාලයක් රාජධානියක් පැවතීම පසුකාලීනව මහනුවර නගරය මුල්කරගෙන උඩරට ස්වාධීන රාජධානියක් ඇරඹීමේ මූලික අවස්ථාව වශයෙන් ද සැලකිය හැකි ය.

ඉක්බිති හයවන පරාක්‍රමබාහු ක්‍රි.ව. 1415 දී කෝට්ටේ අගනුවර කරගන්නා විට ගම්පොළ රාජකීයයන්, ප්‍රභූවරුන් සහ උඩරට ජනතාව ඔහුගේ ආධිපත්‍ය පිළිගත්හ. එනිසා හයවන පරාක්‍රමබාහුගේ අවසානය තෙක් උඩරට ප්‍රදේශ ඔහුගේ අණසක යටතේ පාලනය විය. උඩරට තමන්ට පක්ෂපාතී ව තබාගැනීම සඳහා ඉතා සූක්ෂම ව කටයුතු කළ හයවන පරාක්‍රමබාහු රජු උඩරට කුමාරිකාවක් ද ආවාහ කරගත්තේ ය.

---

4 අබයසිංහ, දේවරාජ, සෝමරත්න,1977, 02 පිට.

5 එළු අත්තනගලු වංසය, සංස්. කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර, ඩෙස්කෝ යන්ත්‍රාලය, කැලණිය, 1954, 66 - 67 පිටු.

6 පූජාවලිය,සංස්. සිරි තිලකසිරි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 2010, 194 පිට.

7 එළු අත්තනගලු වංසය, 67 පිට.

## උඩරට ස්වාධීන වීමට දරන ලද ප්‍රයත්න

කෝට්ටේ රාජධානියේ ආරම්භකයා වූ හයවන පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1412 - 1467) යටතේ උඩරට ප්‍රදේශ කෝට්ටේට යටත් ප්‍රදේශයක් වශයෙන් පැවති බව ඉහත සඳහන් කෙරුණි. ඒ සමයේ ජෝතිය සිටාණ විසින් සහ ගම්පල ඇපාණ නම් දෙදෙනෙක් හයවන පරාක්‍රමබාහු රජුට යටත්ව සාමන්ත පාලකයන් වශයෙන් උඩරට ප්‍රදේශ පාලනය කළ බව ඒ රජුගේ හතළිස් හයවන රාජ වර්ෂයේ නිකුත් කරන ලද මඩවල සෙල්ලිපියෙන් හෙළි වේ.[8] (1. ඡායාරූපය) මඩවල සෙල්ලිපියේ සඳහන් ජෝතිය සිටාණ හයවන පරාක්‍රමබාහු රජුගේ පනස් දෙවන රාජ්‍ය වර්ෂයේ දී (ක්‍රි. ව. 1464) උඩරට ඇති කළ කැරැල්ල උඩරට ස්වාධීන වීම සඳහා දරන ලද වැදගත් ප්‍රයත්නයකි. රාජාවලියට හා අලකේශ්වර යුද්ධයට අනුව ජෝතිය සිටු ස්වාධීන වීම සඳහා කළේ අවුරුදුපතා කෝට්ටේට රාජකාරිය සඳහා එවන මිනිසුන් නතර කිරීම, ස්වාධීන පාලකයෙක් මෙන් අංගම්පොර නැරඹීම, පස් රට සේනාවට තාන්න මාන්න දීම, ගම් පමුණු කොට දීම හා අයබදු නොයැවීමයි. ''ශ්‍රී පරාක්‍රමබාහු රජ ඔටුනු පැළඳ පනස්දෙකක් අවුරුදු මහරජකම් කර උඩරට රජකරන සෝජාන සිටුරජ අවුරුදු පතා එවන අයබඳුත් නේවා වැඩට එන මිනිසුනුත් නේවා ප්‍රමාද කර අංගම්පොර ඇර ඉඳිනා බව අසා'' ලෙස ඒ බැව් රාජාවලියෙන්[9] ''එකලට උඩරට රජකම් කරන ජෝතිය සිටු නම් වූ රජතෙම අවුරුදු පතා එවන බඳුපඬුරුත් නේවා මෙහෙවරට එවන මිනිසුනුත් ප්‍රමාද කොට පස්රට සේනාවට මාන්න තාන්න දී ගම්පමුණු දී සටන් අරවා ඉඳිනු අසා'' වශයෙන් අලකේශ්වර යුද්ධයෙත් ඒ බැව් සඳහන් ව තිබේ.[10] අම්බුළුගල කුමරුට එම කැරැල්ල මර්දනය කිරීමේ වගකීම හයවන පරාක්‍රමබාහු විසින් පවරන ලද අතර එම කැරැල්ල මැඩලීමට අම්බුළුගල කුමරු සමත් විය.[11] හයවන පරාක්‍රමබාහු විසින් ජෝතිය සිටු උඩරට ඇති කළ කැරැල්ල පරාජයට පත්කිරීම පිළිබඳ පැරකුම්බාසිරිතේ ද සඳහන් වේ.[12] කැරැල්ල මැඩ පැවැත්වීමෙන් පසු උඩරට ප්‍රදේශය පාලනය හයවන පරාක්‍රමබාහු විසින් ගම්පොළ රජ පෙළපතට අයත් කුමාරයෙකුට භාර දුන්නේය.[13] ජෝතිය සිටුවරයා විසින් උඩරට ස්වාධීන වීමට දරන ලද ප්‍රයත්නය මෙසේ මැඩ පැවැත්වීමට සමත් වූයේ තාවකාලිකව ය.

---

8 IC, Vol. VIII, 2008, P. 50.

9 රාජාවලිය, සංස්. ඒ. වී. සුරවීර, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල, 1997, 219 පිට.


10 අලකේශ්වර යුදය, සංස් ඒ. වී. සුරවීර, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2009, 22 - 23 පිටු.

11 රාජාවලිය, 219 පිට.

12 පැරකුම්බා සිරිත,සංස්. රෝහිණී පරණවිතාන, මධ්‍යම සංස්කෘතික අරමුදල, 1997, ක. 48.

ජෝතිය සිටු නරවර ගනඳර ක — ද
සිතිය කර ගියෙ පර සක්වළ වැ — ද

13 රාජාවලිය, 219 පිට.



1. ඡායරූපය හයවන පරාක්‍රමබාහු රජුගේ මඩවල සෙල්ලිපිය

හයවන පරාක්‍රමබාහු රජුගේ මියයාමත් සමඟ කෝට්ටේ රාජධානිය තුළ අභ්‍යන්තරික දේශපාලන අර්බුද මතු විය. හයවන පරාක්‍රමබාහුගෙන් පසු කෝට්ටේ සිහසුනට පත් වූයේ ඔහුගේ මුනුබුරු ජයවීර පරාක්‍රමබාහු ය (ක්‍රි. ව. 1467 - 1469). එහෙත් ඔහුගේ හිමිකම් පිළිනොගත් යාපනයේ පාලන කටයුතු මෙහෙය වූ සපුමල් බණ්ඩාර කුමරු ඔහු හා සටන් වැදුණි. මෙම දේශපාලනික අර්බුදය හමුවේ සිය අභිමතාර්ථ නැවත සඵල කරගැනීමට උඩරැටියෝ දොඩම්වෙල පරාක්‍රමබාහු ඇපාගේ බෑණා වූ ''මෙනවර තුනයාරුන්'' නැමති කුමාරයා යටතේ උඩරට ප්‍රදේශ ස්වාධීන කර ගැනීම සඳහා කැරැල්ලක් දියත් කළහ.[14] ජයවීර පරාක්‍රමබාහු මෙම අවස්ථාවේ දී පුද්ගලිකව සේනාව උඩරටට මෙහෙයවා කැරැලිකරුවන් මර්දනය කොට මෙනවර තුනයාරුන්ට, උඩරට ප්‍රධානීන්ට හා උඩරට ජනතාවට අභය දුන් බව ඔහුගේ ගඩලාදෙණි පුවරු ලිපියේ[15] සඳහන්වේ. තාවකාලිකව එලෙස උඩරට ඇති වූ කැරැල්ල මර්දනය කරන ලද නමුත් කෝට්ටේ රාජ්‍යයට කප්පම් ගෙවූ අර්ධ ස්වාධීනත්වයෙන් මිදී පූර්ණ ස්වාධීනත්වයක් ලැබීම සඳහා උඩරට ජනතාව තුළ තිබූ අභිලාෂය එයින් නතර නොවී ය. මෙයින් සුළු කලකට පසු සපුමල් බණ්ඩාර කුමරු ජයවීර පරාක්‍රමබාහු රජු පරාජයට පත්කොට භුවනෙකබාහු (ක්‍රි. ව. 1469 - 1480) නමින් කෝට්ටේ සිහසුනට පත් විය. ඔහු මේ නමින් පෙනී සිටි හයවන පාලකයා විය. ඔහුගේ රාජ්‍ය කාලයේ දී කැකුලන්දල සිරිවර්ධන පතිරාජ හා කුරගම හිමියාන නම් නායකයින් දෙදෙනෙක් විසින් විශාල පිරිසක් ද සමඟ කළුගඟ හා වලවේ ගඟ අතර වූ විශාල ප්‍රදේශයක ''සිංහල පෙරළිය'' නමින් හැඳින්වෙන කැරැල්ලක් ඇති කරන ලදී.[16] හයවන භුවනෙකබාහු රජුට විරුද්ධව ඇති වූ එම ව්‍යාකූල දේශපාලන තත්ත්වයෙන් ප්‍රයෝජනගත් යුද හමුදාව විසින්

14 Somaratne G.P.V., **Political History of the Kingdom of Kotte (A.D. 1400-1521)**, Depani Press, Maharagama, 1975, PP 125-126.

15 මහාචාර්ය මැන්දිස් රෝහණදීර මහතාට අනුව මෙම ගඩලාදෙණි පුවරු ලිපිය අයත් වනුයේ ජයවීර පරාක්‍රමබාහුට නොව අටවන වීර පරාක්‍රමබාහු රජුටය, **IC**, Vol. VIII, 2008, PP. 77-78.

16 රාජාවලිය, 1997, 219 පිට.

තෝරා ගන්නා ලද යයි අර්ථය ඇති සේනාසම්මත වික්‍රමබාහු (ක්‍රි.ව. 1472/3 - 1510)[17] උඩරට ප්‍රදේශ කෝට්ටේ රාජධානියෙන් ස්වාධීන කරගැනීමට සමත් විය.

## මහනුවර පාලන මධ්‍යස්ථානය කොටගත් ප්‍රථම පාලකයා වූ සේනාසම්මත වික්‍රමබාහු[18]

උඩරට සිහසුනට පත් සේනාසම්මත පරාක්‍රමබාහු සිය අගනුවර වශයෙන් තෝරාගන්නා ලද්දේ සෙංකඩගල නුවර හෙවත් වර්තමාන මහනුවරයි.[19] පැරණි අගනුවරක් වශයෙන් උඩරට ප්‍රදේශයේ පැවති ගම්පොල වෙනුවට නව අගනුවර වශයෙන් මහනුවර තෝරාගත්තේ ඇයි දැයි නිශ්චිතව කිව නොහැකි ය. ගම්පොල තුන්වන වික්‍රමබාහු (ක්‍රි.ව. 1357 - 1374) රාජ්‍ය සමයට අයත් අම්පිටිය ගිරි ලිපියේ[20] 'සෙංකඩගල දෙවියන්' නම් දෙවියකු ගැන සඳහන් වන හෙයින් මහනුවර දේශපාලන මධ්‍යස්ථානයක් වශයෙන් වැදගත්කමක් ලබන්නට සියවසකටත් පෙර පටන් ආගමික අතින් වැදගත්කමක් ලබා සිටි බව සිතිය හැකි ය. තවද පහත රට සිට උඩරටට පැමිණිය හැකි මාර්ග වූ ගලගෙදර සහ බලන කපොලු කෙරෙහි වඩාත් සුපරීක්ෂාකාරීව සිටිය හැකි ස්ථානයක මහනුවර පිහිටා තිබීමත් මහවැලි ගංගාවෙන් තුන්පැත්තකින් ආරක්ෂා වී පැවතීමත් මහනුවර අගනගරය වශයෙන් තෝරාගැනීමේ දී වැදගත් විය. සේනාසම්මත වික්‍රමබාහුගේ අටවන රාජවර්ෂයට අයත් ගඩලාදෙණි පර්වත ලිපිය[21] අනුව රජුගේ ආධිපත්‍ය පැවති ප්‍රදේශ ලෙස සිදුරුවාණ, දෙනුවර, බලවිට, සාරසිය පත්තුව, මාතලය, අටසිය පත්තුව, දුම්බර, පන්සිය පත්තුව, ගොඩරට, මතුරට, ඌව, අටපෙඩිය, සොරබොර, කොත්මලේ, ගම්පොළ, දොළොස්බාගේ, බුලත්ගම, මහතොට, ත්‍රිකුණාමලය හා මඩකලපුව පෙන්නුම් කරයි. මෙම ලිපිය අනුව පහළොස්වන සියවස අවසාන වන විට උඩරට රාජධානියට වර්තමානයේ නැගෙනහිර, මධ්‍යම, ඌව සහ තමන්කඩුව ප්‍රදේශය ද ඇතුළත් වූ බව පෙනේ. එම තොරතුරු සන්සන්දනාත්මකව බලන විට උඩරට, ඌව, රජරට ඇතුළු ලංකාවෙන් හරි අඩක් තරම් ප්‍රදේශයක් සේනාසම්මත වික්‍රමබාහු යටතේ පැවති බව කිව හැකි ය. ගඩලාදෙණි ශිලාලේඛනයේ සඳහන් නොවන මායාදුනු රට හෙවත් සතර කෝරළය ද සේනාසම්මත වික්‍රමබාහු පැමිණ ජයගත් බව අලුත්නුවර ලිපි දෙකකින්[22] හෙළි වේ. අලුත්නුවර සෙල්ලිපි දෙකේ දින වකවානු දක්වා නැතත් ගඩලාදෙණි ශිලාලිපිය පිහිට වූ අටවන වර්ෂයෙන් පසු කලෙක සතර කෝරළය සේනාසම්මත වික්‍රමබාහු විසින් ජයගන්නා ලද බව සිතිය හැකි ය.

කෙසේ නමුත් සේනාසම්මත වික්‍රමබාහුගේ දේශපාලනික කාර්ය සංසිද්ධි අධ්‍යයනයේ දී අවස්ථා දෙකකදී පමණ කෝට්ටේ රජුට තිබූ පක්ෂපාතීත්වය විසංධිකොට කෝට්ටේ රජුට අවුරුදු පතා යවන අය පඬුරු පමණක් නොව රාජකාරියට යවන මිනිසුන් ද නතර කොට සිටීමට ප්‍රයත්න දැරුව ද 1510 දී ඔහුගේ මරණය සිදුවන තෙක්ම ඔහුට මුළුමනින් ම

17 මහාචාර්ය මැන්දිස් රෝහණදීර සේනාසම්මත වික්‍රමබාහු රාජ්‍යත්වයට පත් වූ වර්ෂය ලෙස ක්‍රි.ව. 1463 පෙන්වා දෙයි, බලන්න රෝහණදීර මැන්දිස්, අස්ගිරියෙන් උඩරට ඉතිහාසය, තරංජි ප්‍රින්ටර්ස්, නාවින්න, මහරගම, 2009, 51 -62 පිටු.

18 රාජරත්නාකරයේ බුද්ධවර්ෂ 2085 (ක්‍රි.ව. 1542) දී වීර වික්‍රම නැමති රජකු සෙංකඩගල නුවර (මහනුවර) ප්‍රථම වරට අගනුවර කරගත් බව සඳහන් වෙතත් එම පුවත සාවද්‍ය පුවතක් බව පිළිගැනේ. රාජරත්නාකරය, සංස්. කරුණාදාසරූපසිංහ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ. 10, අබයසිංහ ටිකිරි, දේවරාජ ශ්‍රීමතී, සෝමරත්න ජී. පී. වී., උඩරට රාජධානිය (1470 - 1818), සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්මන්ට්ස් සමාගම, කොළඹ, 1977, 09 - 10 පිටු.

19 කුරුණෑගල හතරවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ දී මහනුවර නගරය ඉදිකිරීම සේනාධිපති සිරිවර්ධන නැමැත්තකු විසින් සිදු කොට ඇත.මහනුවර අස්ගිරිය විහාරයේ ආරම්භය ද එම වකවානුවට දිව යයි.

20 IC., Vol. VII, 2014, PP. 61.

21 IC., Vol. VIII, 2008, PP. 53.

22 EZ., Vol. IV, 1943, PP. 266-267.

ස්වාධීන වීමට හැකි වූයේ නැත. මෙලෙස පූර්ණ ස්වාධිපත්‍යය භුක්ති විඳීමට අසමත් වුවත් උඩරට රාජ්‍යයේ නිර්මාතෘවරයා වශයෙන් සේනාසම්මත වික්‍රමබාහු ගෞරවයට පාත්‍ර වේ. පසු කලක උඩරට රාජධානියට ලංකාවේ එක ම දේශීය රාජධානිය වශයෙන් නැගී සිටීමට හැකි වූයේ සේනාසම්මත වික්‍රමබාහු විසින් දමන ලද අඩිතාලම මතිනි. දෙවන රාජසිංහට පසු උඩරට රජවරුන් සේනාසම්මත වික්‍රමබාහු හා නෑකම් කීමට යුහුසුලු වීමෙන් උඩරට රාජ්‍යයේ නිර්මාපකයා වශයෙන් ඔහු ලැබූ කීර්තිය ශතවර්ෂ දෙකක කාලයක් නොනැසී තිබූ බව පැහැදිලි වේ.[23]

සේනාසම්මත වික්‍රමබාහු උඩරට ප්‍රදේශ කෝට්ටෙ ආධිපත්‍යයෙන් මුදවාගත් අවධියේ සිට 1592 දී පළමුවන විමලධර්මසූරිය රජු උඩරට සිහසුනට පත් වූ අවස්ථාව දක්වා වූ කාල පරිච්ඡේදය උඩරට රාජවලිය පිළිබඳ ඉතිහාසඥයන් අතර පවා මතභේද පවති. සේනාසම්මත වික්‍රමබාහුගේ මරණයෙන් පසු ඔහු පුත් ජයවීර බණ්ඩාර (ක්‍රි.ව. 1511-1551) සිහසුනට පත් වි ය. අනතුරු ඔහු පුත් කරලියද්දේ බණ්ඩාර (ක්‍රි.ව. 1552-1582) උඩරට ප්‍රදේශ සීතාවක පළමුවන රාජසිංහට යටත් වන තෙක් සිහසුන දැරී ය.[24] කරලියද්දේ බණ්ඩාර රජු කෝට්ටේ ධර්මපාල රජු සමඟ ද සම්බන්ධතා ගොඩනගා ගනු ලැබී ය. ධර්මපාල රජුගේ පළමු මෙහෙසිය කරලියද්දේ බණ්ඩාරගේ සහෝදරියක් වූ අතර ඇය මිය ගිය විට කෝට්ටේ පාලකයාට සිය දියණිය විවාහ කර දෙනු ලැබී ය. මෙම විවාහ සම්බන්ධතාවල අපේක්ෂාව වූයේ සීතාවක රාජධානියෙන් උඩරටට පැවති අභියෝගවලට මුහුණ දීම බව පැහැදිලි ව පෙනෙන කරුණකි. මේ අතරතුර කරලියද්දේ බණ්ඩාර සෘජුව පෘතුගීසීන් සමඟ සම්බන්ධතා ගොඩනගා ගත් අතර කතෝලික දහම ද වැළඳ ගත්තේය. කරලියද්දේ කතෝලිකයෙකු වීම උඩරට ප්‍රභුවරුන්ගේ, භික්ෂූන්වහන්සේලාගේ සහ සාමාන්‍ය ජනයාගේ නොසතුටට හේතු විය. ඇතැම් ප්‍රභුවරු රජු කතෝලික ආගම වැළඳ ගැනීම නිසා රජුට විරුද්ධව කුමන්ත්‍රණය කිරීමට පවා පෙළඹුණහ. ඒ සඳහා වීරසුන්දර බණ්ඩාර නම් උඩරට ප්‍රභුවරයාගේ නායකත්වය යටතේ උඩරැටියන් සංවිධානය වූ අතර, ඔහු විසින් කරලියද්දේ බණ්ඩාර සිහසුනෙන් පහකර දැමීමට සීතාවක පළමුවන රාජසිංහගේ සහය ද අපේක්ෂා කරන ලදී. ඒ අනුව සීතාවක පළමුවන රාජසිංහ රජු ක්‍රි.ව. 1582 දී උඩරට ආක්‍රමණය කළ අවස්ථාවේ දී කරලියද්දේ බණ්ඩාරට තම රාජධානිය අතහැර දමා පලා යාමට සිදුවිය.[25] පෘතුගීසීන් වෙත ගිය කරලියද්දේ බණ්ඩාර සහ මෙහෙසිය ත්‍රිකුණාමලයේ දී මිය ගියහ. පෘතුගීසිහු කරලියද්දේ බණ්ඩාරගේ පවුලේ ඉතිරි වූ අය මන්නාරමට ගෙන ගොස් රඳවා තබා එයින් පසුව ගෝවට ගෙන ගිය හ.

කෝට්ටේ හා සීතාවක රාජධානිවලින් එල්ල වූ අභියෝග හමුවේ සැලකිය යුතු කාලයක් සිය ස්වාධීනත්වය ආරක්ෂාකර ගත් උඩරට රාජ්‍යය මේ අන්දමට 1582 දී සීතාවක රාජ්‍යයට යටත් වි ය. උඩරැටියන් මේ අවස්ථාවේ දී සීතාවක රාජසිංහ රජුට ආධාර උපකාර කළේ ඔහුට උඩරට රාජ්‍ය පාවා දී නිසොල්මනේ සිටීමට නොවේ. මෙවැනි පසුබිමක ගිව

23 අබයසිංහ ටිකිරි, දේවරාජ ශ්‍රීමතී, සෝමරත්න ජී. පී. වී., උඩරට රාජධානිය (1470 1818), සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්මන්ට්ස් සමාගම, කොළඹ, 1977, 12 පිට.

24 මහාචාර්ය මැන්දිස් රෝහණදීර මහතා අස්ගිරි තල්පත මූලාශ්‍රය කරගනිමින් මීට වෙනස් මතයක් ඉදිරිපත් කොට ඇත. සේනාසම්මත වික්‍රමබාහු ක්‍රි.ව. 1463 - 1483 දක්වාත්, ඔහු පුත් පළමුවන ජයවීර ක්‍රි.ව. 1483 - 1497 දක්වාත්, අනතුරුව කුණයම රජු ක්‍රි.ව. 1497 - 1514 දක්වාත් සිහසුන හෙබවූ බවත් ඉන් අනතුරුව සේනාසම්මත වික්‍රමබාහුගේ දෙවන පුත් දෙවන ජයවීර ක්‍රි.ව. 1514 -1542 දක්වා සිහසුන දැරූ ඒ මහතා පෙන්වා දෙයි. පසුව ක්‍රි.ව. 1543 සිට 1581 දක්වා දෙවන ජයවීරගේ පුත් කරලියද්දේ බණ්ඩාර සිහසුන හෙබවූ බව එතුමාගේ අදහසයි. රෝහණදීර මැන්දිස්, අස්ගිරියෙන් උඩරට ඉතිහාසය, තරංජි ප්‍රින්ටර්ස්, නාවින්න, මහරගම, 2009, 51 -62 පිටු.

25 අබයසිංහ ටිකිරි, දේවරාජ ශ්‍රීමතී, සෝමරත්න ජී. පී. වී., උඩරට රාජධානිය (1470 1818), සීමාසහිත ලේක් හවුස් ඉන්වෙස්මන්ට්ස් සමාගම, කොළඹ, 1977, 20 පිට.

භක්තිකයෙකු වූ රාජසිංහ රජු උඩරට ප්‍රදේශවල බෞද්ධ පූජනීය ස්ථාන පවා ආඬිගුරුන්ට පවරා දීමටත් බෞද්ධ භික්ෂූන්ට හිරිහැර කිරීමටත් ක්‍රියා කළේ ය. මන්දාරම්පුර පුවතේ රාජසිංහ රජුගේ බෞද්ධ විරෝධී කටයුතු පිළිබඳ සවිස්තරව සඳහන් වේ.[26]

බෞද්ධයන් වූ උඩරට ජනතාව රාජසිංහ රජුගෙන් මෙබඳු පාලනයක් අපේක්ෂා නොකළහ. මේ නිසා වීරසුන්දර බණ්ඩාර විසින් රාජසිංහ රජුට විරුද්ධව කැරැල්ලක් ඇරඹූ අවස්ථාවේ දී ඔහුට උඩරට ජනතාවගේ සැලකිය යුතු සහයක් හිමි විය.එහෙත් රාජසිංහ රජු වීරසුන්දරව **''වීරසුන්දර බණ්ඩරට දිවුරුන් දී වලගම වට්ටාරම දෙනවාය කියා උපායෙන් ගෙන්වා වික්‍රමසිංහ මුදලින් හා සෙනෙවිරත්න මුදලින් හා දෙදෙනා ඉස්සර යවා කැඳවාගෙන ඇවිදින් ගොලෑබොක්කේ විදියේ වළ කපා කොළ අතුරුවා වසා තබා වීරසුන්දර බණ්ඩාර මැදිකරගෙන මුදලි දෙදෙනා දෑලෙන් ඇවිත් වළ දෙකොණෙන් යන විට වීරසුන්දර බණ්ඩාර බොරුවළේ වැටී උල් අනී මළහ''**ලෙස උපායශීලීව මරාදැමූ බව රාජාවලියේ සඳහන් කර ඇත.[27]

වීරසුන්දර බණ්ඩාර මරවා කැරලි මර්දනය කිරීමෙන් පසුව රාජසිංහ රජු උඩරට රාජ්‍යයේ පාලන කටයුතු සඳහා ඔහුගේ සහෝදරියකගේ පුතෙකු වූ නිකපිටියේ බණ්ඩාර පත් කළ අතර පෙරටත් වඩා කුරිරු ලෙස පාලන කටයුතු මෙහෙයවී ය. එහෙයින් කතෝලික ආගම වැළඳගත් ගම්පොළ වංශයට අයත් දොම් ප්‍රැන්සිස්කු නම් මුදලි කෙනෙකු විසින් නැවතත් උඩරට කැරැල්ලක් ඇති කරන ලදී. දොම් ප්‍රැන්සිස්කුගේ කැරැල්ල බෙහෙවින් සාර්ථකව තිබිය දී පෘතුගීසීහු උඩරට කටයුතුවලට මැදිහත් වූහ. මේ අතරතුර සීතාවක රාජසිංහ උඩරට ආක්‍රමණය කිරීමට පෙර උඩරට රජු වූ කරලියද්දේ බණ්ඩාරගේ බෑණනුවන් වූ යමසිංහ බණ්ඩාර ද වීරසුන්දර බණ්ඩාරගේ පුත් වූ කොනප්පු බණ්ඩාර[28] ද පෘතුගීසි හමුදාවක් ගෙන උඩරට බලා ගමන් ගත් හ. මේ අවස්ථාවේ උඩරට ප්‍රභූන් ද භික්ෂූන් වහන්සේලා ද මොවුන් පිළිගත් බව සඳහන් වේ. සෙංකඩගල නුවරට පැමිණි මෙන් අනතුරුව යමසිංහ බණ්ඩාර හෙවත් දොම් පිලිප් කුමරු පෘතුගීසීන් විසින් සිහසුනට පත් කරන ලදී. එහෙත් වැඩි දිනක් යාමට මත්තෙන් යමසිංහ බණ්ඩාර මියගිය හෙයින් පෘතුගීසි හමුදාව එලවා දමා උඩරට ජනතාවගේ සහයෝගයෙන් කොනප්පු බණ්ඩාර 1592 දී විමලධර්මසූරිය නමින් සෙංකඩගල අභිෂේක ලැබී ය.[29]

## පළමුවන විමලධර්මසූරිය රජු යටතේ උඩරට රාජධානිය (ක්‍රි.ව. 1592 1604)

පළමුවන විමලධර්මසූරිය රජු උඩරට සිහසුනට පත්වීම ඒ රාජ්‍යයේ ඉතිහාසයෙත් ලංකා ඉතිහාසයෙත් නව යුගයක් උදා කිරීමට සමත් වූ සිද්ධියක් විය. මෙම සිද්ධිය හේතු

---

26 මන්දාරම්පුර පුවත, මන්දාරම්නුවර චන්ද්‍රානන්ද හිමි සංස්., සංදේශා පබ්ලිෂර්ස්, පාදුක්ක, කවිය 55.
බික් සගුන් මරමින
බණපොත් වෙහෙර නසමින
සිව දෙව්දු වඳිමින
නළල අලු ගැය මිසදිටු ගෙන

27 රාජාවලිය, 1997, 239 පිට.

28 මෙම දෙදෙනාට අමතරව කරලියද්දේ බණ්ඩාරගේ දියණිය වූ කුසුමාසාන දේවිය ද (දෝන කතිරිනා) මේ වනවිට පෘතුගීසීන්ගේ ආරක්ෂාව යටතේ පසුවිය.

29 මන්දාරම්පුර පුවත, කවිය 78.
පිලිප් කුමරු යමපුර හැර විගසකිනා
ප්‍රතිකාල් වැසියනු දු පන්නා බිය දෙමිනා
සෙංකඩ පුරය සරසා සුරපුර ලෙසිනා
රජ විය විමලදම් සූරිය යන නමිනා

කොට ගෙන එතැන් සිට සියවස් දෙකක පමණ කාලයක් තුළ උඩරට රාජධානිය දේශීය මෙන් ම විදේශීය සතුරන් සමඟ සටන් කරමින් සිංහල බෞද්ධ සංස්කෘතිය ආරක්ෂා කරන ප්‍රධානතම රාජ්‍යය බවට පත්විය.

සිය රාජ්‍යයේ බලය තහවුරු කිරීමේ දී විමලධර්මසූරිය රජුට ප්‍රබල සතුරන් දෙකොටසකට මුහුණ දීමට සිදු විය. එනම් සීතාවක රාජසිංහ හා පෘතුගීසින් ය. විමලධර්මසූරිය රජ වූ 1592 වර්ෂයේ දී ම සීතාවක රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කළේ ය. ඒ වනවිට මහලු වයසට පත් වී සිටි රාජසිංහ රජු මානසික වශයෙන් මෙන් ම කායික වශයෙන් ද රෝගාතුරව බෙලහීනව සිටි අතර, රට වැසියාගේ ද දැඩි අප්‍රසාදයට ලක් වී සිටියේ ය. එබැවින් පෘතුගීසින් යටතේ යුද්ධ ශිල්පය හදාරා රණශූරත්වයක් ලබා සිටි පළමුවන විමලධර්මසූරිය රජුට පහසුවෙන් සීතාවක රාජසිංහ රජු පරාජය කළ හැකි විය. 1593 දී රාජසිංහ රජු මරණයට පත් වූ අතර ඔහුගේ මරණයත් සමඟ[30] සීතාවක රාජ්‍යය තුළ ඇති වූ මතභේද හේතුකොට පැන නැගි අවුල් සහගත තත්ත්වයෙන් ප්‍රයෝජනගත් පෘතුගීසිහු ධර්මපාල රජුගේ නමින් සීතාවක සියලු ප්‍රදේශ කෝට්ටේට ඈදා ගැනීමට ක්‍රියා කළ හ. 1591 සිට පෘතුගීසින් යාපන රාජ්‍යයේ ද ඔවුන්ට අවනත කුමාරයෙකු සිහසුට පත් කොට තිබුණි. මෙම වතාවරණය තුළ සමස්ත දිවයිනේ ම දේශපාලන ආධිපත්‍ය තමන් සතු කර ගැනීමේ අපේක්ෂාවෙන් සිටි පෘතුගීසින්ට පැවති ප්‍රධානම අභියෝගය වූයේ විමලධර්මසූරිය රජු යටතේ පැවති ස්වභාධර්මයාගෙන් මනා ලෙස ආරක්ෂා වූ උඩරට රාජධානියයි. සමස්ත දිවයිනම සිය අණසකට නතු කර ගැනීමේ අරමුණින් ප්‍රථම පෘතුගීසි කපිතාන් ජනරාල්වරයා වූ පේරෝ ලෝපේස් ද සූසා ලංකාවට සම්ප්‍රාප්ත විය. ඒ අනුව පෘතුගීසිහු ඔවුන් භාරයේ සිටි උඩරට සිහසුනේ හිමිකාරිය වූ කුසුමාසන දේවිය උඩරට රජ කරවීම සඳහා 1594 දී පේරෝ ලෝපේස්ද සූසාගේ මෙහෙයවීමෙන් උඩරට ආක්‍රමණය කළ හ. 1594 දන්තුරේ සිදු වූ මේ සටනින් පෘතුගීසින් සමූල ඝාතනය කළ විමලධර්මසූරිය රජු කුසුමාසන දේවිය ලබා ගෙන ඇය විවාහකර ගැනීමෙන් උඩරට රාජ්‍යයේ නිත්‍යානුකූල අයිතිය තහවුරු කරගැනීමට ද සමත් විය.[31]

අනිවාර්යයෙන් ම නැවත ඇති විය හැකි වූ පෘතුගීසි තර්ජනවලට මුහුණදීම සඳහා විමලධර්මසූරිය රජු යුධ සම්පත් හා ආර්ථික සම්පත් දියුණු කිරීමට කටයුතු කරන ලදී. යුද්ධායුධ තැනීම සඳහා හම්බන්තොට ගිරුවාව, ඌව, දුම්බර, බිම්තැන්න, සබරගමුව, සත්කෝරළය සහ මන්නාරම ප්‍රදේශවල යකඩ කර්මාන්තශාලා 171ක් ආරම්භ කළ බව සඳහන් වේ.[32] නැතහොත් ඒවා වැඩි දියුණු කළේ ය. මැණික් සම්පත ලබා ගෙන ආර්ථිකය දියුණු කිරීම සඳහා රත්නපුරය, මුලත්ගම, කිවුලේගෙදර, දියවාතේ, විල්ගම, විල්කඩ වැනි ස්ථානවල මැණික් ආකර හැත්තෑ හතරක් ද කරවිය.[33] එමෙන් ම තුන්කෝරළය, හත්කෝරළය, නවකෝරළය, අනුරාධපුරය, රුහුණු කතරගම, ගිරිවාපත්තුව, ඌව, හේවාහැට, බදුල්ල, මාතලේ, වෙල්ලස්ස වැනි ප්‍රදේශවල වී වගාව, කපු වගාව, පළතුරු වගාව මෙන් ම විවිධ

30 සීතාවක රාජසිංහ රජු විමලධර්මසූරිය සමඟ කළ සටනින් පැරදී පසු බසිද්දී පෙතංගොඩ උයනේ දී විෂ උණ කටුවක් ඇනිගිලන් වූ බවත් පසුව දොඩම්පේ ගණිතයා නම් පුද්ගලයා එම විෂ වර්ධනය වීමට කටයුතු කළ නිසා රජු මිය ගිය බවත් රාජාවලියේ සඳහන් වේ. රාජාවලිය, 1997, 242 පිට.

31 රාජාවලිය, 1997, 246 පිට.

32 මන්දාරම්පුර පුවත, කවිය 152.

33 එම, 153.

ශිල්ප කර්මාන්ත දියුණු කිරීමට ද රජු ක්‍රියාකරන ලදී.[34]

ජනතාවගේ පක්ෂපාතීත්වය දිනා ගැනීම සඳහා උඩරට ප්‍රදේශවල බුදු සසුන දියුණු කිරීමට රජු පියවර ගත්තේ ය. මේ අතින් ඉටු කරන ලද වැදගත්ම සේවය නම් මහනුවර දෙමහල් දළදා මාළිගයක් කරවා දන්තධාතුන් වහන්සේ මහනුවර නගරයට වැඩම කරවනු ලැබීමය.[35]බුරුම දේශයට (රක්ඛංග) ඇමතියන් යවා නන්දිචක්ක ආදී සඟුන් ගෙන්වා දිවයිනේ යළි උපසම්පදාව ඇති කිරීම ද විමලධර්මසූරිය රජුගෙන් සිදුවූ ඉතා වැදගත් ආගමික සේවාවකි.[36]රජුගේ මෙම ආගමික කටයුතු සඳහා මෙන් ම දේශපාලනික කටයුතු සඳහා ද රජුගේ දෙවනගල ශිලාලේඛනයේ[37] සඳහන් දෙවනගල රතනාලංකාර හිමියන්ගේ නොමඳ සහය හිමි වූ බව සිතිය හැකි ය. මෙලෙස උඩරට රාජ්‍යයේ තම බලය තහවුරු කරගත් විමලධර්මසූරිය රජුගේ ඊළඟ ප්‍රයත්නය වූයේ පෘතුගීසීන් මුහුදුබඩ ප්‍රදේශවලින් පළවා හැරීමට උත්සාහ කිරීමයි. ඒ සඳහා ඔහු විසින් හැකි සෑම උපක්‍රමයක් ම උපයෝගී කරගත් අතර, පෘතුගීසි ප්‍රදේශවල ඔවුන්ට විරුද්ධව ඇති වූ කැරලි කරුවන්ට පවා සහාය දක්වන ලදී. මේ අතරතුර වර්ෂ 1602 දී පෘතුගීසි කපිතාන් ජනරාල්වරයා වූ අසවේදු යටතේ උඩරටට ආක්‍රමණයක් එල්ල විණි. මෙයට මූලික හේතුව වූයේ ලන්දේසීන් සමඟ විමලධර්මසූරිය රජු සම්බන්ධතා පැවැත්වීම ය.[38] එම අවස්ථාවේ දීත් තීරණාත්මක ලෙස පෘතුගීසීන් පරාජයට පත් කිරීමට උඩරැටියෝ සමත් වූහ.

## සමාලෝචනය

මේ අන්දමට පළමුවන විමලධර්මසූරිය රජු උඩරට නව රාජවංශයක් ආරම්භ කළා පමණක් නොව එම රාජ්‍ය ස්ථාවර පදනමකට ගෙන ඒමට ද සමත් විය. විමලධර්මසූරිය රජු ආරම්භ කළ නව රාජවංසයේ උරුමකරුවෝ සියවසකටත් අධික කාලයක් එනම් 1739 දක්වා උඩරට ප්‍රදේශ පාලනය කළ හ. (1. සටහන) එම වකවානුවේ දී සහ 1815 දක්වා වූ කාල පරිච්ඡේදය තුළත් පිළිවෙලින් පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආධිපත්‍ය යටතේ පවා පහත රට ප්‍රදේශවල වාසය කළ සිංහල බෞද්ධ ජනතාව ද උඩරට රජු තම රජු වශයෙන් පිළිගැනීම සිදු කළහ.

34 එම, 155

දෙදහස් කෙත් සහ කපු වී පලතුරු නෙක උයන් වතු ද
මෙලෙසින් සදවා සැම දන නිකරුන කල් නොයවන ලෙද
කැටයම් නිමි නෙක සිප් සත ගබඩා කරවා මනනද
දනයෙන් ලක උතුරා සැම දන පොබකරවා මන කොද

35 මහාවංසය, 94, 14.

ද්විභූමකං ධාතුගෙහං කාරාපෙත්වා මනොහරං
තහිං දාඨං ඨපෙත්වාන පූජෙසි සතතාදරො

36 මහාවංසය, 94, 15 - 20.

37 IC., Vol. IX, 2015, PP 23.

38 විමලධර්මසූරිය රජුගේ පාලන කාලයේ දී ජොරිස් වැන් ස්පිල්බර්ජන් (Joris Van Spilbergen) සහ සිබෙල් ද වර්ට් නම් ලන්දේසි දූතයන් දෙදෙනා උඩරට රාජ්‍යයට පැමිණියත් යහපත් සම්බන්ධතාවක් ඇති නොවී ය.

පළමුවන විමලධර්මසූරිය (1592 - 1594) + කුසුමාසන දේවිය

පුතා පුතා දුව දුව

පළමුවන විමලධර්මසූරිය රජුගේ ඥාති සහෝදර සෙනරත් (1604 - 1635) + කුසුමාසන දේවි

දෙවන රාජසිංහ (1635 - 1687)

දෙවන විමලධර්මසූරිය (1687 - 1707)

ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ (1707 - 1739)

ශ්‍රී විජය රාජසිංහ (1739 - 1747)


කීර්ති ශ්‍රී රාජසිංහ (1747 - 1782)

රාජාධි රාජසිංහ (1782 - 1798)

ශ්‍රී වික්‍රම රාජසිංහ (1798 - 1815)

නායක්කර් වංශික රජුන්

1. සටහන පළමු විමලධර්මසූරියගේ සිට උඩරට රාජාවලිය






උඩරට

## හැඳින්වීම

ක්‍රි. ව. දාහතර
මධ්‍යස්ථාන දෙක එ
හා පහතරට යන ෙ
රාජධානියට ඉතා නු
උඩරට යනුවෙන් හාවි
ලෙසට සකස් වන
සිරිවද්ධනපුර හා ක
සාක්ෂ්‍ය හමුවේ.[2] ශ්‍රීව
ඇති මෙම රාජධානිය
හැඳින්විණි. මෙම උඩ
වී ඇති නමුත් ඊට වි
විශාලත්වයට පත් වී
වැනි සුළු නගර කිහි
මහනුවර යනුවෙන්
පමණ කාලයෙහි දී
පටන් ගෙන ඇති බව

## විමර්ශනය

සේනාසම්මත
(1551-1581), පළමුවැ
සෙනරත් (1604-1635
ශ්‍රී වීරපරාක්‍රම නරේන
(1747-1781), රාජාධිරා
දෙන උඩරට රාජ්‍යය
භුක්ති විඳීමට සමත්
ලෙසට කටයුතු කළ

1 අභයසිංහ, ටිකිරි. ශ්‍රී
කොළඹ, 1977, 7 පිට
2 සෙනෙවිරත්න, අනුර
කොළඹ, 1989, 12 පි
1960, 3 පිට; වෝල්ට
අය, රජයේ මුද්‍රණ
3 කරුණාතිලක, ඒ වි
පුරාවෘත්ත, ග්‍රන්ථ ප්‍ර
4 සෙනෙවිරත්න, 1989
5 අභයසිංහ, දේවරාජ